## <u>අයදුම්කරුට උපදෙස් - දැව ප්‍රවාහන</u>

1) මෙම අයදුම්පතේ 01 පිටුව හා 02 පිටුවේ ඔබට අදාල කොටස් නිවැරදිව සම්පූර්ණ කරන්න.

2) දැව කදන් වල මැද වට ප්‍රමානය අවරෝහන පිළිවෙලට පිහිටන පරිදි දැව ලැයිස්තුව සඳහන් කරන්න.

3) දැව ලැයිස්තුවට අදාලව මිණුම් ලබා ගැනීම ග්‍රාම නිලධාරී විසින් සිදු කල යුතුවේ.

4) දැව ලැයිස්තුවට වට කණු ඇතුලත් කිරීමේදී එම දැව කදන් වෙන වෙනම සඳහන් කිරීම අවශ්‍ය නොවන අතර, එක් එක් පන්තියට අදාලව ( 1 පන්තියේ වට කණු , 11 පන්තියේ වට කණු , 111 පන්තියේ වට කණු ලෙස) මුළු වට කණු සංඛ්‍යාව සඳහන් කිරීම ප්‍රමානවත් වේ.

5) ගස් පිහිටි ඉඩමේ ඔප්පු පිටපත හා පිඹුරේ පිටපත ග්‍රාම නිලධාරී විසින් සහතික කර අයදුම්පත සමග ඉදිරිපත් කල යුතුවේ.

6) ප්‍රාණ භුක්ති අයිතිය හෝ සෙසු හවුල්කරුවන් සිටී නම් ඔවුන්ගේ එකගතාවය පලකර, ග්‍රාම නිලධාරී ඉදිරියේ අත්සන් කල කැමැත්ත ප්‍රකාශ කිරීමේ ලිපි ඉදිරිපත් කල යුතුවේ. මිය ගොස් නම් අදාල මරණ සහතික ඉදිරිපත් කරන්න.

7) නොබෙදූ ඉඩමක් නම් අනෙක් පාර්ශ්ව වල එකගතාවය ලිඛිතව ලබා ගත යුතුවේ.

8) උකස් කල ඉඩමක් නම් අදාල මූල්‍ය ආයතනයේ එකගතාවය ලිඛිතව ලබා ගත යුතු වේ.

9) ඉඩම් හිමියාගෙන් දැව මිලදී ගැනීමක් නම් නියමිත මුදල් භාර ගැනීමේ කුවිතාන්සියක් ඉදිරිපත් කරන්න. පරිත්‍යාගයක් හෝ ප්‍රදානයක් නම් ඒ බව සනාථ කිරීමට ඉඩම් හිමියාගෙන් ලබා ගත් ලිපියක් ඉදිරිපත් කරන්න.

10) කොස් / රටදෙල් / ගැහැණු තල් / පොල් දැව ප්‍රවාහනයක් නම් කැපුම් බලපත්‍රයේ මුල් පිටපත ඉදිරිපත් කල යුතුවේ.